# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

වෙළුම 05 කාණ්ඩය 01 මාර්තු 2012


# උක් පර්යේෂණ හා සංවර්ධනය නව මගකට තාක්ෂණය බිම් මට්ටමට ගෙන යාමට කඩිනම් වැඩ පිළිවෙළක්



සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ දැනුම හා තාක්ෂණය විද්‍යාගාර තුලට සීමා නොකර ගොවීන් හා කර්මාන්ත මට්ටමට ගෙන ගොස් ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමට දායක කරවීමට පර්යේෂණ ආයතනයෙන්ම වැඩ පිලිවෙලක් සැකසේ. මෙම වැඩ පිළිවෙලෙහි මූලික පියවර ලෙස බීජ උක් තවාන් ස්ථාපනය උක් පර්යේෂණ ආයතනයෙන්ම සිදුකර, වැඩි දියුණුකළ උක් ප්‍රභේද තව දුරටත් ගුණනය කර වාණිජ වගා සඳහා භාවිතා කිරීමට ගොවි ජනතාවට සහ සීනි සමාගම්වලට ලබාදීමට නියමිතය.

මෙම වැඩ සටහනේ ආරම්භක පියවර ලෙස උක් ගොවීන් සහ සීනි සමාගම් වෙත නව ප්‍රභේද වල බීජ උක් නිකුත් කිරීමට අවශ්‍ය අත්තිවාරම් බීජ ගුණනය කීරීමේ තවාන් ස්ථාපනය කිරීම සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා අතින් පසු ගිය දින උඩවලව උක් පර්යේෂණ ආයතනයේ උත්සවාකාරෙයෙන් සිදු කෙරුනි.

8 පිටුවට...

හින්ද චින්තන ඉදිරි දැක්ම ථාර්ථවත් කර දේශිය සීනි ර්මාන්තය තුලින් සීනි නිෂ්පාදනය, වශ්‍යතාවයෙන් 40% දක්වා ගෙන යන සංවර්ධන ගමන් මගේ ව සංධිස්ථානයක් සටහන් කරමින් ළු අපනයන බෝග ප්‍රවර්ධන මාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ ැතිතුමා විසින් අත්තිවාරම් බීජ ණනය කිරීමේ තවාන ස්ථාපනය රඹමින්. මෙම අවස්ථාවට ත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු න්ත්‍රී ගරු රංජිත් සොයිසා ැතිතුමා, සුළු අපනයන බෝග වර්ධන අමාත්‍යාංශයේ ගරු ත්‍රිකම් වජිර නාරම්පනාව, උක් ර්යේෂණ ආයතනයේ සභාපති ර්ල් සුදුවැල්ල,අධ්‍යක්ෂ ආචාර්ය න්.සී. කුමාරසිංහ, පාලක මණ්ඩල ාමාජික ලක්ෂ්මන් කුරේ හත්වරුන් ඇතුළු සම්භාවනීය මුත්තන් සහභාගි විය.



### 2012 පර්යේෂණ වැඩසටහන් සමාලෝචන රැස්වීම උඩවලවේදී



2012 වර්ෂයේ පර්යේෂණ වැඩසටහන් සමාලෝචන රැස්වීම 2012.03.15 සහ 16 දෙදින තුල උඩවලව උක් පර්යේෂණ ආයතනයේදී පැවැත්වින. උක් පර්යේෂණ ආයතනයේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම සමාලෝචන රැස්වීමේ විද්වත් මණ්ඩලය ලෙස උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එන්.සී. කුමාරසිංහ, හිටපු අධ්‍යක්ෂක වරුන් වන ආචාර්ය එන්. ධර්මවර්ධන, ආචාර්ය එච්. කේ. සුනිල්, හිටපු සභාපති එන්.වී.ටී.ඒ වේරගොඩ, හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් වන ආචාර්ය යූ. රත්නවීර, ඒ. ෂන්මුගනාදන්, පාකිස්තානු ශකර්ගාන්ජ් උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය සහීඩ් ඇෆ්ගන් හා හිටපු ප්‍රධාන පර්යේෂණ නිළධාරී ජී. චන්ද්‍රසේන යන මහත්වරුන් කටයුතු කරන ලදී.

4 පිටුවට...

ඇතුලත පිටු :


- **උක් කර්මාන්ත තොරතුරු**
  - සෙවනගල හා පැල්වත්ත උක් කර්මාන්ත රජයේ පාලනයට
  - ශ්‍රී ලංකා පාකිස්තාන සහයෝගිතා ව්‍යාපෘතිය
- **පර්යේෂණ හා ව්‍යාප්ති තොරතුරු**
  - උක් වගාවේ සුදු පත්‍ර රෝගය/ තෘණාකාර ප්‍රරෝහ රෝගයන් පැතිරීමේ අවදානමක්
  - 2012 පර්යේෂණ වැඩසටහන සමාලෝචන රැස්වීම
  - දෙනියායේ උක් අභිජනන උප මධ්‍යස්ථානය සංවර්ධනයට පියවර
- **තාක්ෂණ පුහුණු වැඩසටහන අතරින්**
  - පස්සර ගොවිමහතුන් උඩවලවේදී
  - කිලිනොච්චි ගොවීන් උක් වගාවට
- **උක් සහ සීනි නිෂ්පාදනය වර්තමාන තොරතුරු**
  - සීනි කාර්මාන්තයේ අනාගතය
- **ලෝක සීනි කර්මාන්තය හා අනාගත ප්‍රවනතා**
- **උක් වගාව සමඟ අතුරු භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන**
- **නව උක් ප්‍රභේද ගුණනය කර ගොවි බිමට ලබාදීමට සංවර්ධනය වන බීජ උක් තවාන**

# සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්ත රජයේ පාලනයට



සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තය රජයට පවරාගෙන සංවර්ධනය කිරීමට පියවර ගනී. පාඩු ලබන ආයතන රජයට පවරා ගැනීමේ (ඌන ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ) පනත යටතේ මෙම පවරා ගැනීම සිදුකර ඇති අතර මෙම ආයතන වල කාර්යක්ෂමතාවයන් ඉහළ නංවා මෙමගින් යැපෙන ගොවි ජනතාවගේ ආදායම් සුරක්ෂිත කිරීමටත් අඩුමට්ටමකට පත්ව ඇති සීනි නිෂ්පාදනය යථා තත්වයට පත්කර වැඩි දියුණු කිරීමටත් මේ මගින් කඩිනම් පියවර ගැනීමට නියමිතය. උක් පර්යේෂණ ආයතනය තාක්ෂණික දැනුම වඩාත් ඵලදායක ලෙස ලබා ගැනීමට ඵලදායිතා ප්‍රවර්ධන ගරු අමාත්‍ය ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාගේ මග පෙන්වීම යටතේ පැල්වත්ත හා සෙවනගල කර්මාන්ත නව පරිපාලනයන් දැනටමත් වැඩ කටයුතු ආරඹා ඇත.



සම්පූර්ණ රාජ්‍ය ව්‍යවසායක් ලෙස 1986 දී ඇරඹි සෙවනගල සීනි කර්මාන්තායතනය 2002 වසරේ දී පෞද්ගලීකරනය කරන ලද අතර 1986 දී නිෂ්පාදන අරඹා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක්ව පැවති පැල්වත්ත සීනි කර්මාන්තායතනය 2003 දී සම්පූර්ණ පෞද්ගලික ව්‍යාපාරයක් බවට පත්විය. 1994 වසරේදී මෙ.ටො.72 දේශීය උපරිම නිෂ්පාදනයක් වාර්ථා කිරීමට දායක වූ මෙම ආයතන පසු ගිය වසර වන විට මෙ.ටො. 31ක් පමණ අඩු නිෂ්පාදන මට්ටමකට පත්ව තිබුනි. එසේම ගොවීන් සැලකිය යුතු පිරිසක් උක් වගාවෙන් ඉවත්ව සිය වගා බිම් වෙනත් බෝග වගා කිරීමට යොදවා තිබුනි.

### ශ්‍රී ලංකා - පාකිස්ථාන් පර්යේෂණ සහයෝගිතා ව්‍යාපෘතිය

## පාකිස්ථානයෙන් ලැබුනු උක් ප්‍රභේද උක් පර්යේෂණ ආයතනය තුල ඇගයීමට ලක් කෙරේ

පාකිස්ථාන හා ශ්‍රී ලංකාව අතර ආරම්භ කරන ලද සම්ප්‍රදායික නව අභිජනන ක්‍රම මගින් උක් ශාකය වැඩිදියුණු කිරීම සඳහා වූ පස් අවුරුදු පර්යේෂණ සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ පකිස්ථානයෙන් ලැබුනු වාණිජ ලෙස ව්‍යාප්ත වූ උක් ප්‍රභේද 59ක් උක් පර්යේෂණ ආයතනය තුල ඇගයීමට ලක් කරයි. මුහුම් කර බීජ ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික පියවර ලෙස දැනට උක් පර්යේෂණ ආයතන ශාක නිරෝධායතනයෙහි පර්යේෂණ වගාවන්හි එම ප්‍රභේද ස්ථාපනය කර ඇගයීමට පියවර ගෙන ඇති අතර, මෙම ව්‍යාපෘතියේ උක් ප්‍රභේද හුවමාරු කරගැනීම යටතේ උක් පර්යේෂණ ආයතනය විසින් පකිස්ථානයට උක් ප්‍රභේද 30ක් හා මුහුම් 200ක උක් බීජ ලබා දීමට කටයුතු කරන ලදී.

2010 වසරේ දී ඇරඹි මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය දායකත්වය සලසන්නේ පාකිස්ථානයේ පන්ජාබ් පර්යේෂණ මණ්ඩලයයි.

ව්‍යාපෘතියේ සහයෝගීතා ආයතනය වන පාකිස්ථානයේ ආයුබ් කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයට අනුබද්ධිත ෆයිසාල්බාද්හි පිහිටි උක් පර්යේෂණ ආයතනය, කෘෂිකර්මික ජෛව තාක්ෂණික ආයතනය සහ ජානත් හි පිහිටි ශකර්ගාන්ජ් සීනි පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකා උක් පර්යේෂණ ආයතනය සමඟ එක්ව පර්යේෂණ ව්‍යාපෘතිය මෙහෙයවයි.

"

තාක්ෂණික හා විද්‍යාත්මක දැණුම හුවමාරු කර ගැනීම, නව වැඩි දියුණු කළ වාණිජ උක් ප්‍රභේද හුවමාරු කිරීම හා උක් ප්‍රභේද අභිජනනය කර ලබාගත් උක් බීජ හුවමාරු කිරීම, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. පාකිස්ථානය වැනි ලෝකයේ ප්‍රධාන සීනි නිෂ්පාදක රටක උක් පර්යේෂණ ආයතනය තුල පුහුණු වීමේ හා ක්‍රියාකාරීව දායක වීමේ අවස්ථාව අප ආයතනයේ පර්යේෂකයන්ට මෙම ව්‍යාපෘතිය මගින් සැලෙසනු ඇත. එමෙන්ම පාකිස්ථාන උක් පර්යේෂණ ආයතනයේ විද්‍යාර්ථයන් මෙරටට පැමිණ උක් පර්යේෂණ ආයතනයේ විද්‍යාර්ථයන් සමඟ විද්‍යාත්මක සංවාදයක් පැවැත්වීම ද සිදු කෙරේ. මෙම ව්‍යාපෘතියේ ඉදිරි පියවර යටතේ සැලසුම් කර ඇත. මෙලෙස දෙරට අතර ඇතිකරගත් සහයෝගීතා ව්‍යාපෘතිය මගින් නව තාක්ෂණික දැනුම හා ජාන සම්පත් හුවමාරුව දෙරටෙහිම උක් පර්යේෂණ කටයුතු වල නව මාවත් විවර කිරීමට ඉවහල් වනු ඇත.



ෆයිසාල්බාද් හි ස්ථාපිත
ශ්‍රී ලංකාවෙන් ලබාදුන් උක් පැල



හන්තාන ශාක නිරෝධායතනයේ ස්ථාපනය කර ඇති
පාකිස්තානයෙන් ලැබුණු උක් ප්‍රභේද

# උක් වගාවේ සුදු පත්‍ර රෝගය/ තෘණාකාර ප්‍රරෝහ රෝගයන් පැතිරීමේ අවදානමක්......

උක් වගාවේ සුදු පත්‍ර රෝගය/ තෘණාකාර ප්‍රරෝහ රෝගය ප්‍රදේශ කිහිපයක හානිදායක මට්ටමින් ව්‍යාප්ත වී ඇති බැවින් තවදුරටත් ව්‍යාප්ත වීමට වැළැක්වීමට කඩිනමින් පියවර ගැනීමේ අවශ්‍යතාවය උක් පර්යේෂණ ආයතනය අවධාරනය කරයි. පැල්වත්ත හා සෙවනගල ප්‍රදේශයන්හි සැලකිය යුතු උක් වගා බිම් ප්‍රමාණයක් දැනට මෙම රෝග දෙක මගින් හානියට ලක්ව ඇත.

මෙම රෝගී තත්වයන් ශ්‍රී ලංකාවේ උක් වගාවන්හි වසංගත තත්වයෙන් වරින් වර ඇතිවූ අතර එම තත්වයට හේතු කාරකය වන්නේ ෆයිටොප්ලාස්මා නැමැති ක්ෂුද්‍ර ජීවී විශේෂයකි. රෝග ආසාධිත බීජ උක් සිටුවීම මගින් ඇතිවන මෙම රෝගය පැතිරවීමට ඩෙල්පොසෙපලස් මෙනොනි නැමැති පත්‍ර කීඩෑවා දායකවන බව තහවුරු වී ඇත.

දැනට වසර කිහිපයකට පෙර වසංගත තත්වයෙන් ව්‍යාප්තවූ මෙම රෝගයෙන් උක් වගාවන් බේරාගැනීමට රෝගයට




සෙවනගල සහ හිඟුරාන ක්ෂේත්‍ර නිළධාරීන් දැනුවත් කරමින්

ඔරොත්තු දෙන එස්.එල් 8306 උක් ප්‍රභේදය උක් වගාවන් සඳහා යොදා ගැනීම සහ රෝගී වගාවන් දිනපතා පරීක්ෂා කර රෝගී උක් පඳුරු ගලවා ඉවත්කර පුළුස්සා දැමීම ඇතුළු නිර්දේශිත රෝගපාලන ක්‍රම අනුගමනය කිරීම සාර්ථක ලෙස දායක විය.

සුදු පත්‍ර රෝගය හඳුනාගත හැකි ලක්ෂණ වන්නේ සම්පූර්ණයෙන්ම සුදු පැහැවූ පත්‍ර ශාකයේ ඉහල කොටසේ ඇති වීමයි මුලින් ලපටි පත්‍ර වල මැදනාරටියට සමාන්තරව සුදු හෝ ක්‍රීම් පැහැ ඉරි ලෙස ඇතිවී පසුව මුලු පත්‍රය පුරාම පැතිර සුදු පැහැවේ. ශාකයේ ඉහළ කොටසේ පාර්ශික අංකුර ඇති නොවන අතර පත්‍ර ඉතා ලංව පිහිටයි. අධික ලෙස පඳුරු දැමීම මෙන්ම උක් ගස්වල පුරුක් කෙටිවීම නිසා ශාකය මිටිවූ පඳුරක් ලෙස දිස්වේ. ඇඹරීම සඳහා ගතහැකි උක් ගස් යම් ප්‍රමාණයකට ඇතිවේ.




තෘණාකාර ප්‍රරෝහ රෝගයේදී පත්‍ර නාරටිවලට සමාන්තරව වෙනස්වූ පලලින් යුත් කෙලින් පිහිටි ඉරි ලෙස සුදු පැහැවීම ඇතිවී පසුව ඒවා එකතුවී මුළු පත්‍රයම සුදු පැහැවේ. අධික ලෙස පඳුරු දැමීම නිසා උක් පඳුර සුදු පැහැති පත්‍ර සහිත තෘණ පඳුරක් ලෙසට දිස්වෙන තත්වයට පත්වේ. පසුව මෙම උක් පඳුර මියයයි. උක් ගස් අධික ලෙස කුරුවේ. ඒවායේ පහළ සිට ඉහළට පාර්ශවික අංකුර ඇතිවේ. පත්‍රවල ප්‍රමාණය කුඩාවේ. ඇඹරීම සඳහා ගත හැකි උක් ගස් ඇති නොවේ.

← **රෝගී උක් වගාවන්**

මෙම රෝගය පාලනය කිරීමට පහත දැක්වෙන පියවර අනුගමනය කළයුතු බව උක් පර්යේෂණ ආයතනය නිර්දේශ කර ඇත.

* රෝගයන් සඳහා අඩු පාත්‍රීයතාවයක් ඇති උක් ප්‍රභේද වගාකිරීම සඳහා භාවිතා කිරීම. උක් පර්යේෂණ ආයතනය මගින් නිපදවා නිර්දේශ කර ඇති එස්.එල්. 8306 සහ එස්.එල්. 92 5588 යන උක් ප්‍රභේදයන් මෙම රෝගයන් සඳහා යම් ප්‍රමාණයකට ප්‍රතිරෝධිතාවයක් දක්වන බව තහවුරු වී ඇත.
* සිටුවීම සඳහා නිරෝගී බීජ උක් භාවිතා කිරීම. මේ සඳහා නිර්දේශිත ලෙස උණුදිය ප්‍රතිකාරය සහ පාලන ක්‍රම අනුගමනය කල අනුමත බීජ උක් තවාන් වලින් පමණක් බීජ උක් ලබාගැනීම හා වාණිජ වගාවන් වලින් ලබාගන්නා උක් දඬු බීජ උක් ලෙස භාවිතයෙන් වැලකීම.
* සිටුවීමෙන් පසු වගාව නිතිපතා හොඳින් පරීක්ෂා කර බලා, ඉහත දැක්වූ ලක්ෂණ සහිත රෝගී උක් පඳුරු තිබේ නම් ගලවා ඉවත් කර පුළුස්සා දැමීම.
* වල් මර්දනය, පොහොර යෙදීම සහ අනෙකුත් පාලන කටයුතු නිසියාකාරව කිරීම.
* රෝගය ඉතා දරුණු ලෙස ව්‍යාප්තව ඇතිවිට එම වගාවන්හි අස්වනු නෙලා ඉවත්කර කෙටිකාලීන බෝගයක් වගා කර නැවත නීරෝගී වගාවක් ස්ථාපනය කිරීම.

# 2012 පර්යේෂණ වැඩසටහන සමාලෝචන රැස්වීම ........

2012 පර්යේෂණ වැඩසටහන මෙන්ම 2011 පර්යේෂණ සහ තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන් වල ප්‍රගතියද සමාලෝචනයට ලක් වූ මෙම වැඩසටහනේදී උක් කර්මාන්තායතන නියෝජනය කරමින් එක් වූ නිළධාරි මහතුන් හා විද්වත් මණ්ඩල සාමාජික මහතුන්, අදහස් හා යෝජනා මඟින් පර්යේෂණ වැඩසටහන් වල ගුණාත්මක භාවය ඉහල නැංවීමට දායක වූ අතරම දේශීය හා ජාත්‍යන්තර සංවර්ධනය තුල සීනි කර්මාන්ත අවශ්‍යතා සාක්ෂාත් කිරීමට කාර්යක්ෂමව දායක වීමේ අවශ්‍යතාවය අවධාරණයට ලක් කළහ.



"සම්ප්‍රදායික හා නවීන අභිජනන තාක්ෂණ මඟින් උක් ශාක වැඩිදියුණු කිරීම" මැයෙන් විශේෂ දේශණයක් පැවැත්වූ පාකිස්තානයේ ශකර්ගාන්ජ් උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය සහීඩ් ඇෆ්ගන් මහතා





උක් පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ආචාර්ය එන්. ධර්මවර්ධන මහතා "ජෛව ඉන්ධනයක් ලෙස එතනෝල් හා එම ව්‍යුත්පන්න වල වැදගත්කම ඉහළ යාම" මැයෙන් විශේෂ දේශනයක් පවත්වමින්

"උක් වගාව ආශ්‍රිත කෘෂිකාර්මික කටයුතු සඳහා කාලගුණ සේවා" මැයෙන් ආරාධිත දේශනය පැවැත්වූ පරිසරය, කාලගුණය හා තාක්ෂණය පදනමේ ප්‍රධාන විද්‍යාඥ ආචාර්ය ලරීෆ් සුහයර් මහතා



## ආයතන තොරතුරු

### දෙනියායේ උක් අභිජනන උප මධ්‍යස්ථානය සංවර්ධනයට පියවර

දෙනියායේ උක් අභිජනන උප මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දිගු කලක් අඩුපාඩුවක් ව පැවැති යටිතල පහසුකම් දියුණු කිරීමට උක් පර්යේෂණ ආයතනයේ සභාපතිතුමා ඇතුළු පාලක මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ පියවර ගෙන ඇත.



මේ යටතේ අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කර අංග සම්පූර්ණ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.



දැයට කිරුළ 2012 ඔයාමඩුව ජාතික ප්‍රදර්ශනයට එක්වෙමින්



## තාක්ෂණ පුහුණු වැඩස

### හිඟුරාන ගොවි පුහුණුව

හිඟුරාන ප්‍රදේශයේ උක් ගොවීන් සඳහා හිඟුරාන සීනි කර්මාන්තායතන පරිශ්‍රයේදී උක් වගාකිරීම පිළිබඳව එක් දින පුහුණු වැඩ සටහනක් උක් පර්යේෂණ ආයතනය මගින් පවත් වන ලදී. ජාතික වැව්ලි කළමණාකරන ආයතනයේ අනුග්‍රහය යටතේ උක් පර්යේෂණ ආයතනය මගින් මෙහෙයවන ගොවි පුහුණු වැඩ සටහනේ ආරම්භක වැඩ සටහන ලෙස පැවති මෙම වැඩසටහනට ගොවිමහතුන් 45ක් සහභාගී වූහ. සම්පත් දායකයන් ලෙස උක් පර්යේෂණ ආයතන පර්යේෂණ හා තාක්ෂණ හුවමාරු කාර්ය මණ්ඩලය දායක විය. මෙම පුහුණු වැඩසටහනේදී උක් වගාවේ නිෂ්පාදකතාවය වැඩිකරගැනීම සඳහා නව තාක්ෂණික දැණුම භාවිතය පිළිබඳව විශේෂ අවධානයට ලක් කළහ.

### පස්

පස්ස
උක්
පර්
දෙ
නිෂ්
ක්‍රෙ





ාලෝචන රැස්වීම සඳහා සහභාගී වූ විද්වත් මණ්ඩලය





පර්යේෂණ වැඩසටහන් සාකච්ඡාවට
ලක්කරමින්

# ෘන අතරින් ...

## ගොවි මහතුන් උඩවලවේදී

දේශයේ උක් ගොවීන් සඳහා උක් හකුරු නිෂ්පාදනය හා
කිරීම පිළිබඳව එක්දින පුහුණු වැඩසටහනක් උක්
ෟ ආයතකයේදී පැවැත්විනි. ගොවි මහත්ම මහත්මීන් 20
සහභාගී වූ මෙම වැඩ සටහන යටතේ උක් හකුරු
යේ ගුණාත්ම තාවය ඉහළ දැමීම අවධාරනය කරමින්
ාදර්ශනය කරන ලදී.





# කිලිනොච්චි ගොවීන් උක් වගාවට



උතුරු පළාතේ උක් කර්මාන්තය නැවත ඇරඹීමේ නියමු
ව්‍යාපෘතිය යටතේ උක් වගාවන් අරඹමින්





කිලිනොච්චියේ උක් ගොවි බිමක්

# සීනි කර්මාන්තයේ අනාගතය

කේ.ඒ.ඩී.කොඩිතුවක්කු
පර්යේෂණ නිලධාරි - ආර්ථික විද්‍යා, ජීවමිතික හා
තොරතුරු තාක්ෂණ අංශය
උක් පර්යේෂණ ආයතනය

ලොව පුරා වෙසෙන ජනතාවගේ ආහාර ද්‍රව්‍යන් අතර ප්‍රධාන ස්ථානයක් හිමිවන සීනි, රටවල් 121ක පමණ නිපදවනු ලබයි. උක් වලින් මෙන්ම බීට් වලින් ද නිපදවා ගත හැකි වුවත් මුළු සීනි නිෂ්පාදනයෙන් 72%ක් පමණ සහ ජාත්‍යන්තරව වෙළඳාම් වන සීනි වලින් 80%කට වැඩි ප්‍රමාණයක් ද උක් සීනි වේ. බීට් සීනි ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමයට අයත් රටවලටද, උක් සීනි ප්‍රධාන වශයෙන් බ්‍රසීලය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව හා තායිලන්තය වැනි රටවල ද නිපදවයි (F.O.Licht 2010).

සීනි ලෝක වෙළඳ පොලේ අතිශයින් මිල විචලනය වන හා නියාමනය වන ආහාර ද්‍රව්‍යකි. මිල අස්ථායිතාවය, නිෂ්පාදකයින් හා පාරිභෝගයින් යන දෙකොටසටම අහිතකරව බලපාන අතර ඒ හේතුව නිසාම නිෂ්පාදන හා ආනයනික රටවල් ලෝක සීනි මිලෙහි බලපෑමෙන් තම රටවල කර්මාන්තය ආරක්ෂාකර ගැනීම පිණිස විවිධ ප්‍රතිපත්තීන් අනුගමනය කරයි. එහෙත් මෙම ප්‍රතිපත්තීන් මිල අස්ථායිතාවයට තව දුරටත් රුකුල් සපයයි.

ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් අංශයක් බවට සීනි පත්ව ඇත්තේ එය අපගේ වෙළඳ ශේෂයට ඇතිකරන බලපෑම නිසාවෙනි. 2010 වර්ෂයේ මුළු සීනි ආනයන ප්‍රමාණය ටොන් 559,000ක් වූ අතර, ඒ සඳහා රුපියල් බිලියන 41ක් පමණ වැයවී තිබේ. එම මුදල ශ්‍රී ලංකාවේ මුළු සීනි ආනයන වියදමෙන් 2.3%ක් පමණ වේ (ශ්‍රී ලංකා මහ බැංකුව 2010)එසේම ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය මේ දිනවල දැඩිව කථාබහට ලක්වන මාතෘකාවක් බවට පත්ව ඇත්තේ මෙරට සීනි නිෂ්පාදන ප්‍රමාණය දේශීය අවශ්‍යතාවයෙන් 5%ක පමණ මට්ටමට පහත බැස තිබීමත්, දැනට සීනි නිෂ්පාදනය කරමින් පවතින සෙවනගල හා පැල්වත්ත යන කර්මාන්ත ශාලා දෙක පෞද්ගලික අංශය සතුව තිබී මෑතකදී නැවත රජයට පවරා ගැනීමත් හේතුවෙනි.

මෙම ලිපියේ අරමුණ ලෝක සීනි නිෂ්පාදනය, පරිභෝජනය හා මිලෙහි වර්තමාන තත්වය හා අනාගත ප්‍රවනතා සාකච්ඡා කිරීමත්, ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තයට ඒ හරහා ඇතිවන අභියෝග හා අවස්ථාවන් විශ්ලේෂණය කිරීමත්ය.

### ලෝක සීනි කර්මාන්තය හා අනාගත ප්‍රවනතා

ලෝක සීනි වෙළඳ පොලෙහි 2004/05 වර්ෂයට පසුව 2008/09 හා 2009/10 වර්ෂවල සැපයුමෙහි හිඟයක් පැවතියද 2010/11 වර්ෂයේ නැවත අතිරික්තයක් බවට පත්ව තිබේ (වගුව 1)

වගුව 1: ලෝක කේන්ද්‍රාපසාරී සීනි නිෂ්පාදනය, පරිභෝජනය හා අතිරික්තය (1000 ටොන්)

| වර්ෂය | නිෂ්පාදනය | පාරිභෝජනය | අතිරික්තය |
|---|---|---|---|
| 2004/05 | 141100 | 144598 | -3498 |
| 2005/06 | 151492 | 147161 | 4331 |
| 2006/07 | 167468 | 154117 | 13351 |
| 2007/08 | 166685 | 159506 | 7179 |
| 2008/09 | 153325 | 161169 | -7844 |
| 2009/10 | 153678 | 155642 | -1964 |
| 2010/11 | 160948 | 159322 | 1626 |
| 2011/12 * | 168482 | 162002 | 6480 |
| 2020/21 * | 209000 | 207000 | 2000 |

*ඇස්තමේන්තුකර ඇත
මූලාශ්‍රයන් : F.O.Licht's Sugar & Sweetner Report (2011)
OECD/FAO (2011)

2011/12 වර්ෂයේදී කේන්ද්‍රාපසාරී සීනි ටොන් මිලියන 168ක පමණ නිෂ්පාදනයක් ද ටොන් 162 ක පාරිභෝජනයක් ද අපේක්ෂා කරයි. එහෙත් ලෝක සීනි මිල 2011 වර්ෂයේ පෙබරවාරි මාසයේදී වසර 30 කට පසු උපරිම මිල වූ ටොන් එකක මිල ඇමරිකානු ඩොලර් 795.4 ක මට්ටමට ලඟා වූ අතර, දැන් නැවතත් තරමක් අඩුවෙමින් පවතී. පෙර වර්ෂවල පැවති නිෂ්පාදන හිඟය, සීනි නිෂ්පාදිත රටවලට බලපෑ අයහපත් කාලගුණත්ව, ඉල්ලුමෙහි සිදුවූ විචලනයන් මෙන්ම සීනි වෙළඳ පොලේ පවතින විචල්‍ය බව මෙයට හේතු වී ඇති බව ආර්ථික විශ්ලේෂකයින්ගේ මතයයි.

ලෝක ආහාර සංවිධානය මගින් 2011-2020 වර්ෂ සඳහා නිකුත්කර ඇති කෘෂිකාර්මික ඉදිරි දැක්ම වාර්තාවට අනුව 2020/21 වර්ෂය වන විට ලෝක සීනි නිෂ්පාදනය හා ඉල්ලුම පිළිවෙලින් ටොන් මිලියන 209 හා 207 ද්කවා ඉහල යනු ඇතැයි අපේක්ෂා කරයි. නමුත් ඒ වන විට ලෝක සුදු සීනි මිල ටොන් එකක් ඇමරිකානු ඩොලර් 408ක පමණ මට්ටමේ පවතිනු ඇතැයි අනාවැකි පල කරයි. එහෙත් ලෝක සීනි නිෂ්පාදනයේ හා මිලෙහි පවතින අතිශය විචල්‍ය බව හා චක්‍රීය විචලනය අනුව 2014-2016 වර්ෂවලදී නැවත නිෂ්පාදනයේ අඩුවීමක් මෙන්ම, මිලෙහි වැඩි වීමක් අපේක්ෂා කරයි. මේ සඳහා ආර්ථික විශ්ලේෂකයින් දක්වන අනෙක් ප්‍රධාන හේතුවක් වන්නේ ලෝක සීනි නිෂ්පාදනයෙන් 15% කට වග කියන ඉන්දියාවේ සීනි කර්මාන්තයට අදාල ප්‍රතිපත්ති හා නිෂ්පාදනයේ චක්‍රීය විචලනයයි.

### දේශීය සීනි කර්මාන්තය හා අනාගතය

ශ්‍රී ලංකාවේ වාණිජ වශයෙන් සීනි කර්මාන්තය අරඹා වසර 50 කට අධික කාලයක් ගතවී ඇතත්, 2010 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු සීනි නිෂ්පදානය දේශීය අවශ්‍යතාවයෙන් 5% (ටොන් 31500) පමණ විය. අප සතුව දැනට සීනි කම්හල් 4ක් පැවතියද නිෂ්පාදන මට්ටමේ පවතින්නේ සෙවනගල හා පැල්වත්ත කර්මාන්ත ශාලා පමණි.

රජයට කිසිදු නියාමක බලයක් රහිතව 1990 හා 2002 වර්ෂවල සිදු කරන ලද පෞද්ගලීකරණය හේතුවෙන් අපේ සීනි කර්මාන්තය සීඝ්‍ර කඩා වැටීමකට ලක්විය. කන්තලේ හා හිඟුරාණ කර්මාන්ත ශාලා වසා දැමීමට සිදුවූ අතර, පැලවත්ත හා සෙවනගල කර්මාන්ත ශාලාවට දුර්වල කළමණාකරණය හා තම ලාභ උපරිම කිරීම විනා උක් වගාව සඳහා ගොවීන් දිරිමත් නොකිරීම සහ වෙනත් විවිධ කරුණු හේතුවෙන් ගොවීන් උක් වගාවෙන් බැහැරවීම නිසා ප්‍රමාණවත් තරම් උක් ලබා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ දීමට සිදු විය. මේ හේතුවෙන් පසුගිය වර්ෂ කිහිපය තුල ලෝක වෙළඳපොලේ සීනි මිල සීඝ්‍රයෙන් ඉහල යන තත්වයක් තුල වුව ද එයින් ප්‍රයෝජන ගැනීම වෙනුවට නිෂ්පාදනය තව තවත් පසු බැසීමකට ලක්විය (වගුව 2).

වගුව 2: 2006 - 2010 වර්ෂවල දේශීය සීනි කර්මාන්තයේ විචලනය.

| | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| දේශීය නිෂ්පාදනය (ටොන් 1000) | 56 | 29 | 38 | 32 | 31 |
| ආනයන ප්‍රමාණය (ටොන් 1000) | 525 | 481 | 575 | 467 | 559 |
| මුළු සීනි ප්‍රමාණය (නිෂ්පාදනය ආනයනය) (ටොන් 1000) | 581 | 510 | 613 | 499 | 590 |
| ආනයන පිරිවැය (රු. බිලියන) | 23.2 | 17.0 | 22.3 | 25.0 | 41.0 |
| සාමාන්‍ය සිල්ලර මිල (කි. ග්‍රෑමයට/රුපියල්) | 60.20 | 54.30 | 63.19 | 78.61 | 80.00 |

මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව 2011, ශ්‍රී ලංකා මහ බැංකුව

එහෙත් මේ වන විට දැනට නිෂ්පාදන මට්ටමේ පවතින සෙවනගල හා පැල්වත්ත යන කර්මාන්ත ශාලා දෙකම නැවත රජයට පවරාගෙන ඇත. හිඟුරාන හා කන්තලේ කර්මාන්තශාලා ද නැවත නිෂ්පාදන ඇරඹීමට සූදානමින් පසුවේ. රජයට නියාමන බලයක් ද දැන් හිමි වී ඇති අතර, 2020 වන විට දේශීය සීනි අවශ්‍යතාවයෙන් 40% නිපදවීමේ ප්‍රතිපත්තියකද පිහිටා සිටී. (මහින්ද චින්තන ඉදිරිදැක්ම 2010) ආනයනික සීනි මිල මෙරට නිෂ්පාදන මිලට වඩා වැඩි අගයක පැවතීම හා ලෝක සීනි කර්මාන්තයේ අනාගතය

7 පිටුවට...

# උක් වගාව සමඟ අතුරු භෝග වගා ප්‍රවර්ධන වැඩසටහන



උක් සමඟ රටකජු වගා කල හිඟුරාණේ ගොවි මහතෙක්

උක් පර්යේෂණ ආයතනය පැල්වත්ත ප්‍රදේශයේ ගොවිබිම් 18 ක යොදා ගනිමින් ස්ථාපනය කළ උක් සමග අතුරු බෝග වගා ආදර්ශන ගම්මානය අවට ගොවි මහතුන් සඳහා ආදර්ශනය කරන ලදී.



පැල්වත්ත ප්‍රදේශයේ ගොවි ආදර්ශන





පැල්වත්ත ප්‍රදේශයේ ගොවි ආදර්ශන



6 පිටුවෙන්... **සීනි කර්මාන්තයේ අනාගතය....**

පිළිබඳ සුභවාදී පුරෝකථන හේතුවෙන් ආයෝජකයින්, වගාකරුවන් මෙන්ම පාරිභෝගික ආකර්ෂණයද සීනි කර්මාන්තයේ දියුණුව සඳහා යොදා ගැනීමට හැකියාව සැළසී ඇත.

උක් පර්යේෂණ ආයතනය ද මේ සඳහා අවශ්‍ය නව උසස් උක් ප්‍රභේද නිපදවා ගොවීන් හා නිෂ්පාදකයින් වෙත ලබාදීම, උක් වගාවෙන් වැඩි අස්වැන්නක් හා වියදම අඩුකරන නව වගා ක්‍රම හඳුන්වා දීම, පාංශු කළමණාකරණ හා බෝග පෝෂණ ක්‍රම හඳුන්වාදීම, රෝග හා පළිබෝධ මර්ධනය කිරීම, සුළු පරිමාණ වගාවන්ට සුදුසු උපකරණ හඳුන්වාදීම සහ ගොවීන් දැනුමෙන් ශක්තිමත් කිරීම මෙන්ම එම දැනුම භාවිතය සඳහා අවශ්‍ය කටයුතු සලසාදීම තුලින් උපරිම දායකත්වයක් ලබාදීමට හැකි තත්වයකට පත්ව තිබේ.

මෙම සියළු කාරණා හරහා පාරිභෝගිකයා, උක් ගොවියා මෙන්ම කර්මාන්ත ශාලා ද ආරක්ෂාකර ගැනීම සඳහා ප්‍රතිපත්ති සැකසීමට මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමට නියාමන බලය ද රජය සතුව පැවතීම. ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය දියුණු කිරීම සඳහා මහඟු අවස්ථාවක් සපයා දී ඇති අතර ඒ සඳහා කටයුතු කරනු ඇති බවට බලාපොරොත්තු දැල්වී පවතී.

# නව උක් ප්‍රභේද ගුණනය කර ගොවි බිමට ලබාදීමට සංවර්ධනය වන

# බීජ උක් තවාන

**වර්තමානයේදී උක් ගොවීන් මුහුණදී ඇති ප්‍රධාන ගැටළුවක් වන නව උක් ප්‍රභේද වල පිරිසිදු නිරෝගී බීජ උක් නොමැතිවීම සම්බන්ධයෙන් දිගුකාලීන විසඳුමක් ලෙස උක් පර්යේෂණ ආයතනය තුල අත්තිකාරම් බීජ උක් තවාන් සකසා ඒ මගින් ලබා ගන්නා බීජ උක් තවාන් සකසා ගැනීමට හෝ වාණිජ වගාවන් සඳහා අවශ්‍ය බීජ උක් කර්මාන්ත ආයතන සහ ගොවීන්ට ලබා දීමට සැලසුම් කර ඇත.**



සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා තවාන් භූමියේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය කරමින්. මෙම අවස්ථාවට උක් පර්යේෂණ ආයතන පාලක මණ්ඩල සාමාජික මහතුන් ද සහභාගී විය.

මෙම ව්‍යාපෘතිය යටතේ වසර දෙකක් තුල බීජ උක් තවාන් හෙ. 20 ක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන අතර මේ සඳහා උක් පර්යේෂණ ආයතනය සංවර්ධනය කර මෑතකදී හඳුන්වාදුන් එස්.එල්.95 4033, එස්.එල්. 95 4430, එස්.එල්. 96 328, නැමැති නව වැඩි දියුණු කළ උක් ප්‍රභේද මෙන්ම පසුගිය කාලය තුල හදුන්වා දුන් අනෙකුත් ප්‍රභේදද භාවිතා කෙරේ.



සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා තවාන් භූමියේ කටයුතු අරඹමින්.

මෙතෙක් උක් පර්යේෂණ ආයතනය අනුගමනය කළ දැනුම ගොවි ජනතාව තුලට ලබා දී ඒ මගින් පර්යේෂණ තුලින් බිහිවන නව තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීමේ කටයුතු මන්දගාමී වීමට, මූලික අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ක්‍රම වේදයේ දුර්වලතා බොහෝවිට හේතු විය. මෙම තත්වය වෙනස් කිරීම උදෙසා නව ප්‍රභේද ප්‍රවර්ධනයට අරඹන ලද බීජ උක් නිපදවීමේ වැඩ සටහනට සමගාමීව ඉදිරියේදී අනෙකුත් තාක්ෂණ සංවර්ධන උදෙසාත් අවශ්‍ය ද්‍රව්‍ය හා සේවා සපයා ගැනීම සම්බන්ධව මැදිහත් වී ගම්මට්ටමේ තාක්ෂණ සංවර්ධනය වේගවත් කිරීමට නව වැඩ පිළිවෙල යටතේ බලාපොරොත්තු වේ. මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශණයේ දක්වා ඇති පරිදි නව තාක්ෂණය භාවිතය තුලින් සීනි කර්මාන්තයේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට මෙය මහඟු රුකුලක් වනු ඇත.



සංවර්ධනය වන නව උක් ප්‍රභේද සහිත තවාන




**විෂය දායකත්වය**

ආචාර්ය ඒ.පී. කීර්තිපාල - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)
ආචාර්ය අරුණ විජේසූරිය - ප්‍රධාන පර්යේෂණ නිළධාරී
ආචාර්ය ඩබ්.ආර්.ජී. විතාරම - ප්‍රධාන පර්යේෂණ නිළධාරී
එම්.එස්. පෙරේරා මහතා - ප්‍රධාන පර්යේෂණ නිළධාරී
දිනේස් කොඩිතුවක්කු මහතා - පර්යේෂණ නිළධාරී
කේ. එච්. ඩී. ඩී. අබේරත්න මහතා - පර්යේෂණ නිළධාරී
සුනේත්‍රා වනසිංහ මහත්මිය - පර්යේෂණ නිළධාරී

**සංස්කරණය හා පිටු සැකැස්ම**
එම්.එස්. පෙරේරා

**උක් පර්යේෂණ ආයතනය - උඩවලව**
දු.ක. 047 2233233, 2233285
ෆැක්ස් : 0472233233,
වෙබ් අඩවිය : www.sugarres.lk
ඊ මේල් : info@sugarres.lk


උක් කර්මාන්තයට අදාල ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන සහ ඔබගේ අදහස් සහ යෝජනා පහත ලිපිනයට යොමුකරන්න.

සංස්කාරක,
පුවත් හසුන,
උක් පර්යේෂණ ආයතනය,
උඩවලව